www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

බුෂ්ගේ "පුවත්පත් හමුව" සම්මුඛ සාකච්ඡාව පිලිබඳව සසප ජනාධිපති අපේක්ෂකගෙන්:

# "මුග්ධත්වයේ, අවඥාවේ සහ තුච්ඡත්වයේ දසුනක්"

***SEP presidential candidate on Bush 's "Meet the Press" interview:***

**"A spectacle of ignorance, cynicism and indifference"**

**බිල් වෑන් ඕකන් විසිනි**
**2004 පෙබරවාරි 10**

පහත පලවනුයේ, පෙබරවාරි 8වන ඉරිදා එන්බීසී රූපවාහිනියේ "පුවත්පත් හමුව" වැඩ සටහන තුල ජනාධිපති ජෝර්ඩ් බුෂ් සමග පවත්වන ලද සම්මුඛ සාකච්ඡාව පිලිබඳව සමාජවාදී සමානතා පක්ෂයේ ජනාධිපති අපේක්ෂක බිල් වෑන් ඕකන් ගේ ප්‍රකාශයයි.

ඉරිදා එන්බීසීයේ විකාශය වූ "පුවත්පත් හමුව" වැඩ සටහනේ වූ ජනාධිපති බුෂ්ගේ රූපවාහිනීගත සාකච්ඡාවේ අන්තර්ගත වූයේ රට ඉරාක යුද්ධය තුලට ඇදගෙන යාම සඳහා පරිපාලනය විසින් පූර්වයෙන් යොදා ගැනුනු මුසාවාදයන් එලිදරව් වීම හේතුවෙන් වැඩී එන ජනතා වෛරයේ රැල්ල මුලින් සිඳලනු වස් සැලසුම් කරන ලද්දා වූ තවත් මුසාවාදයන් රොත්තකි.

බුෂ්ට තිබෙන අනුමැති රේට්ටුව තියුනු ලෙස පහල වැටීම සහ යුද විරෝධය ඉහලයාම ජනමත විචාරනයන් මගින් එලි වන අතර දී බුෂ්ගේ මෙහෙයුම්කරුවන් මෙම සාකච්ඡාව සැලසුම් කලේ සාපරාධීත්වය සහ මගෝඩිය සමග තුල්‍යාර්ථ වෙමින් පවතින ජනාධිපති ධුරය පිලිබඳ චිත්‍රය යලි වරක් උලා ඔපදැමීමේ අරමුන ඇතිව ය. කෙසේ නමුත් එම වෑයම අසෝබන ලෙස අසාර්ථක විය.

සාකච්ඡාව ඇමරිකානු ජනතාවට ඉදිරිපත් කර සිටියේ, ඉරාකය තුල ඉහල යන මියැදීමේ සහ තුවාල ලැබීමේ සංඛ්‍යාවන් සහ එක්සත් ජනපදය තුල ඉහල යන විරැකියාව යන දෙකම පිලිබඳව වන මුග්ධත්වයේ, අවඥාවේ සහ දයා විරහිත තුච්ඡත්වයේ දර්ශනයකි.

එකොලොස් මසකට ඉහත ඉරාක ආක්‍රමනය දියත් කිරීමට පෙරාතුව දී බුෂ් සහ ඔහුගේ ප්‍රකාශකයින් ඇමරිකානු ජනතාවට යලියලිත් කියා සිටියේ ඉරාක පාලනය සතුව රසායනික සහ ජීව විද්‍යාත්මක අවි ටොන් සිය ගනනක් තිබෙන බවට නිෂේධනය කල නොහැකි සාක්ෂ්‍ය පවතින බවත් එම අවි තොග ගබඩා කර තිබෙන ස්ථාන පිලිබඳව ඇමරිකානු රහස් තොරතුරු අංශ දැන සිටින බවත් ය. ඒ ලෙසටම ඔවුන් දැඩිසේ කියා සිටියේ, බැග්ඩෑඩය න්‍යෂ්ටික අවි නිපදවීමේ සහ ඇමරිකානු නගරවලට ප්‍රහාර එල්ල කිරීමේ ක්‍රම විධීන් සකස් කර ගැනීමේ මාවතට අවතීර්නව සිටින බවයි.

මාස නවයක් මුලුල්ලේ ඇමරිකානු අවි පරීක්ෂකයන්ට කිසිවක් සොයා ගැනීමට නොහැකි වූ තත්වය තුල දී බුෂ් දැන් යුද්ධය සඳහා නව යුක්ති යුක්තයන් පෙරට දමමින් සිටී. සාකච්ඡාව මෙහෙයවූ ටිම් රසට්ට ඔහු පැවසුවේ සදාම් හුසේන් "ආයුධ තැනීමේ හැකියාවෙන් යුතු වූ අනතුරු දායක පුද්ගලයකු" වූ හෙයින් යුද්ධය අත්‍යවශ්‍ය වූ බවය.

මෙය වචනාර්ථයෙන් ලෝකයේ ඕනෑම රටක් ආක්‍රමනය කිරීම සඳහා යොදා ගත හැකි තර්කනයකි. කෙතරම් දුප්පත් වුවද රසායනික සහ ජීව විද්‍යාත්මක අවි ද ඇතුලුව "අවි තැනීමේ හැකියාව" නැතැයි කිවහැකි ජාතියක් නැත. වොෂිංටනයේ පෙර සුමිතුරා වූ සදාම් හුසේන් "අන්තරායදායක" යයි සිතිය හැකි නම් අන් කවර හෝ රාජ්‍ය නායකයකු ගැන ද එසේම සිතිය හැක. මෙම තර්කනය ඉදිරිපත් කිරීමේදී බුෂ් ඉරාකයේ කුපිත කරනු නොලැබූ සහ අයුක්තිසහගත යුද්ධයක් කරගෙන යාම වෙනුවෙන් නිදහස සඳහා මොටවූ තර්කයක් සපයනවා පමනක් නොව අනාගතය සඳහා ඔහුගේ පරිපාලනය සැලසුම් කරන්නේ මොනවාද යන්න ගැන ද සංඥා කරයි.

ඉරාකයේ සමූහ ඝාතන අවි පිලිබඳව සිදුවූවා යැයි කියනු ලබන "රහස් ඔත්තු අසාර්ථකත්වය" පිලිබඳව සොයා බැලීමට ඔහු නම් කල නව "ස්වාධීන" කොමිසම අටවනු ලැබුවේ සාවද්‍ය මවාපෑම් මත යුද්ධයක් දියත් කිරීමට පරිපාලනයට හැකි වූයේ කෙසේ ද කියා විමර්ෂනය කිරීමේ අරමුන සඳහා නොව, ඒ වෙනුවට පරිපාලනයේ වගකීම ආවරනය කිරීමට සහ ඒහා සමාන පදනම් මත නව යුද්ධයන් සූදානම් කිරීමට බව සාකච්ඡාව ආරම්භයේදීම පැහැදිලි විය.

කොමිසම "ත්‍රස්තයට විරුද්ධව යුද්ධය කරගෙන යාමේ හොඳම පිලිවෙල තේරුම් ගැනීමට අනාගත ජනාධිපතිවරුන්ට උදව්වනු ඇතැ"යි බුෂ් පැවසී ය. ඔහු තව දුරටත් මෙසේ කීවේ ය: "ඉරාකයේ දී ඉගෙන ගත් පාඩම් සහ අප එහි යාමට පෙර ඇෆ්ගනිස්ථානයේදී ඉගෙන ගත් පාඩම් ඉරානය හා උතුරු කොරියාව යන රටවල් දෙකට ම යෙදවිය හැකි ඉතා වැදගත් අංශයකි. මන්ද යත් අප තවමත් ජීවත්වන්නේ අනතුරුදායක ලොවකයි."

මෙම සඳහන් කිරීම්වලින් බරපතල ගැටලු මතු කරයි. පරිපාලනය ඉරානයට සහ උතුරු කොරියාවට - මේවා බුෂ්ගේ "පාපයේ අක්ෂය"ට අයත්වන- ඇෆ්ගනිස්ථානයේ දී සහ ඉරානයේ දී දැනටමත් කර ඇති දෙයම කරන්නේ ද? මෙම රටවල සහ අමෙරිකානු හමුදාවල මිනිස් ජීවිත මිල කෙතෙක් නම් වේද?

බුෂ් මෙසේද කීය: "මම යුදජනාධිපතියෙක් මි. මා

මෙම ඕවල් කාර්යාලයේ සිට, විශේෂ ප්‍රතිපත්ති සම්බන්ධව තීන්දු ගනු ලබන්නේ යුද්ධයන් සිත දරා ගෙන ය."

අවසානයේදී ඔහු මෙසේ ප්‍රකාශ කලේ ය: "අප තර්ජනයක් දුටු විට ඒවා ආසන්නයට පැමිනීමට පෙර එම තර්ජන ගැන කටයුතු කිරීම අත්‍යාවශ්‍යය යි මම විශ්වාස කරමි. ඒවා ආසන්නයට පැමිනිවිට ප්‍රමාද වූවා වැඩි ය. මේ අලුත් මාදිලියේ යුද්ධයේ දී ප්‍රමාද වූවා වැඩි ය."

බුෂ් යුද ජනාධිපතියකු වන්නේ කෙසේ ද? කිසිවකුට විරුද්ධව යුද්ධය ප්‍රකාශ කිරීමක් සිදුව නැත. ඉන් පරිබාහිරව ඔහු ඉරාකය ද එහි තෙල් බිම් ද අල්ලා ගැනීමේ සිට සිය රට තුල ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට පරිපූර්න ප්‍රහාරය එල්ල කිරීමද පරිපාලනයේ ප්‍රධාන දේශපාලන පදනම වන ඇමරිකානු මූල්‍ය ප්‍රභූව සඳහා දැවැන්ත බදු සහන දීම ද දක්වා වන සියලුම දේවල් යුක්ති යුක්ත කරවීමක් ඉල්ලා සිටින නිමාවක් නොමැති "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" ක් ප්‍රකාශයට පත්කල පරිපාලනයක මූලිකත්වය දරයි.

"නව මාදිලියේ යුද්ධය" එනම්, වොෂිංටනය "තර්ජනයන් ඒවා ආසන්නයට පැමිනීමට පෙර" එයට එරෙහිව මිලිටරිමය ලෙස ක්‍රියා කල යුතු යයි අවධාරනයන් ලෙසින් බුෂ් විස්තර කරමින් සිටින්නේ ජාත්‍යන්තර නීතිය තුල "නිවාරන යුද්ධය" නැතහොත් "ආක්‍රමනශීලී යුද්ධය" ලෙස හඳුන්වන යුද්ධයි. හිට්ලර්ගේ තුන්වන රයිකය යුරෝපය තුල යුද්ධ සඳහා ද, ජපානය සිය පර්ල් වරාය ප්‍රහාරය සඳහා ද පෙරට දැමූ තර්කනයයි. න්‍යුරම්බර්ග් අධිකරනය නාසීන් විසින් සිදු කැරුනු ප්‍රධාන යුද අපරාධය ලෙස සැලකුවේ මේ මාදිලියේ යුද්ධයන් ය.

ඉරාකය තුල එවන් යුද අපරාධයකට බුෂ් වැරදිකරු ය. එම යුද්ධයේ ගොදුරු බවට පත්වූවෝ දස දහස් ගනනින් වෙති. ඉරාක යුදහානි පිලිබඳව ඉතාම විශ්වාසවන්ත මූලාශ්‍රයට - ඉරාක මෘත ගනනය - අනුව තහවුරු කරන ලද සිවිල් මරන සංඛ්‍යාව දැන් 10,000 දක්වා ඉහල ගොස් ඇති අතර ඉන් වැඩි පිරිස කාන්තාවන් සහ ලමුන් ය.

ඉරාකයට යවන ලද ඇමරිකානු භටයන් අතරින් 534ක් මරු දුටු අතර, ඉරාකයෙන් ඉවත් කර ගැනීමට තරම් බරපතල ලෙස තුවාල වූ හෝ අනතුරට පත් සංඛ්‍යාව 11,000 ත් 22,000 අතර පරාසයක වේ. පරිපාලනය හිතාමතාම නිශ්චිත සංඛ්‍යාව ඇමරිකානු ජනතාවගෙන් වසන්කර තබයි.

මෙම තරුන සොල්දාදුවන්ගෙන් බොහොමයක් තදබල පිලිස්සුම්, අංග ඡේදන, හිසට සිදුවූ දරුනු තුවාල වැනි තදබල බිහිසුනු තුවාලවලින් පෙලේ.

සමූහ ඝාතක අවි නොතිබීම පිලිබඳව සාධකයට අනුව මෙම මිනිස් දිවි පරිත්‍යාගය යුක්ති සහගතදැයි ඇසූවිට බුෂ් සොල්දාදුවන් සහ ඔවුන්ගේ පවුල් පිලිබඳ වගේ වගක් නැති ඇඟ කිලිපොලායන පිලිතුරක් සැපයුවේ ය.

ඇමරිකානු අවි නිරීක්ෂක ඩේවිඩ් කේ ගේ සොයාගැනීම් වැරදියට විස්තර විභාග කිරීමට සහ බැග්ඩෑඩ් පාලනයට අල්කයිඩාව සමග සබඳතා තිබ්නැයි යන පැරනි මුසාවට පන දීමට පෙරට ආ බුෂ් "මෙම රට වෙනුවෙන් පරිත්‍යාගයන් කිරීමට කැමති සෑම පුද්ගලයකුටම අපගේ ප්‍රසංශාව හිමි විය යුතු ය" යි පැවසී ය.

ඇති සැටියෙන් නම්, ඉරාක යුද්ධයේ දී පරිත්‍යාග කල උදවියට බුෂ් පරිපාලනය විසින් සංග්‍රහ කර තිබෙන්නේ නින්දිත ආකාරයට ය. මියගිය අයගේ මෘත දේහ ඇමරිකාවට ගෙන එන අවස්ථා පුවත්පත් මගින් ආවරනය කිරීම තහනම් කරනු ලැබී ය. ඒ මහජනතාවගෙන් එම මරන පිලිබඳ තොරතුරු සඟවා තැබීමට ය. මිලිටරි මිනිස් බල අර්බුදය නිසාවෙන් ඔවුන්ගේ නිල සේවා කාලය දිග්ගස්සවන අතර වාරයේ ම, ඉරාකයේ සිටින සෙබලුනට සරිලන මෙවලම් සැපයීමට අසමත්ව සිටී.

තුවාල ලැබූවන්ට සරිලන සේ වෛද්‍ය ප්‍රතිකාර ලබාදී නැති අතර මාධ්‍යවල උපුටා දැක් වූ එක් නිලධාරියකු ගේ වචනවලට අනුව "බල්ලන්ට මෙන් සැලකීය."

මේ අතර වාරයේ, මීලඟ මූල්‍ය වර්ෂය සඳහා වන අය වැය යෝජනාවල දී යුද ප්‍රවීනයන්ගේ මූලික සෞඛ්‍ය පහසුකම් සඳහා අවශ්‍යවන ප්‍රමානයෙන් ඩොලර් බිලියන 2.6ක් කපා දමා තිබේ. මෙය සිදු කර ඇත්තේ දැනටමත් ඔවුන්ට වෛද්‍යවරයකු හමුවීමට හයමසක් හෝ ඊට වැඩි කාලයක් බලා සිටීමට බල කර තිබෙන තත්වයන් යටතේ ය. බුෂ්ගේ ධවල මන්දිරය යුද ප්‍රවීනයන් ඕනෑම සෞඛ්‍යසේවා පහසුකමක් ලබා ගැනීමේ ලියාපදිංචි වීමක දී පූර්ව කොන්දේසියක් සේ ගාස්තුවක් ගෙවිය යුතු යයි කියා සිටින අතර යුද ප්‍රවීනයන් නිර්දේශිත බෙහෙත් ද්‍රව්‍ය මිලදී ගැනීමේ දී තමන්ගේ අතින් ගෙවන මුදල් ප්‍රමානය දෙගුන කල යුතු යයි ද කියයි. සටනේ දී මිය යන සෙබලුන්ගේ පවුල්වලට ගෙවන ඩොලර් 6000 සහ උවදුරු සහිත දුෂ්කර රාජකාරි සඳහා ගෙවන ඩොලර් සියගනන සාමාන්‍ය ප්‍රමානයකින් වැඩිකිරීමට ගෙන ආ යෝජනා පරිපාලනය විසින් ගරුසරු නැති ආකාරයකට ඉවත දමා තිබේ.

"හමුදාවට සහනය දීමේ" වාචාල කථාවලට පිටුපසින් බුෂ් පරිපාලනය, ඔවුන් සාමාන්‍ය වශයෙන් වැඩ කරන ඇමරිකානුවන්ට සලකන අයුරුම සොල්දාදුවන්ට සහ යුද ප්‍රවීනයන්ට ද සලකන තුච්ච ආකාරය ප්‍රකාශයට පත්වෙයි.

වියට්නාම් යුද සමයේ ජාතික ආරක්ෂක බලකායේ සිය ක්‍රියාකාරකම් පිලිබඳ ව බුෂ් ගේ බොරු දේශපාලන අර්ථහාරයක් ගන්නේ මෙම සන්දර්භය තුල දී ය. එහිදී ඔහුගේ ම වාර්තාව පිලිබඳව විමසා බැලීම "ආරක්ෂක බලකාය හෑල්ලුවට පත් කිරීමේ" වෑයමක් ලෙස පින්තාරු කිරීමට බුෂ් වංචනික ලෙස උත්සාහ කලේ ය. මතුවෙන කාරනාව වනුයේ, ඇතුල් වීම සඳහා දස දහස් ගනනින් පෙල ගැසී සිටි ගුවන් ආරක්ෂක බලකායට මෙය එකල වියට්නාම් යුද්ධයෙන් ගැලවී සිටීමේ මාවතක් ලෙස සැලකුනි. අති විශාල ධනස්කන්ධයකින් ද දේශපාලන ආනුභාවකින් ද යුක්ත පවුලක උපත ලැබූවකු පේලිය කඩාගෙන පැන්නේ කෙසේ ද යන වග සහ අනතුරුව ඔහු තමන්ට නියමික

මුලු කාලය එහි සේවය කිරීමෙන් වැලකී සිටියේ කෙසේද යන වග ය.

අට මාසයකට කලින් තම වගකීම්වලින් ඉවත් වූයේ කෙසේ ද කියා විමසූවිට බුෂ් චපල ලෙස පිලිතුරු දුන්නේ, "ආ, මම හාවර්ඩ් ව්‍යාපාරික විදුහලට යමින් සිටියා. ඉතින් මම මිලිටරියත් එක්ක ඒක බේර ගත්තා" යනුවෙනි.

බුෂ් පරිපාලනය පසුගිය වසර දෙක හමාර තුල තුන් ලක්ෂයක් තරමේ ජාතික ආරක්ෂක භටයන් සහ අතිරේක භටයන් ක්‍රියාත්විත රාජකාරියට කැඳෙව්වේ ය. මෙම කාන්තාවන් සහ පිරිමින් ගෙන් බොහෝදෙනා මරනයට පත්වීමට හෝ තුවාල ලැබීමට මුහුනදීම සඳහා ඉරාකයට සහ ඇෆ්ගනිස්ථානයට පටවා යවනු ලැබීය.

අන්තිමේදී මේ බොහෝදෙනා විශාල පෞද්ගලික ව්‍යසනයක් සහ මුදල් අහිමිවීම් දරාගෙන මාස ගනනාවක් තිස්සේ තම පවුල්වලින් සහ ආදරය කරන්නන්ගෙන් වෙන් කරනු ලැබ සිටී. ඔවුන්ගෙන් කී දෙනෙකුට හාවඩ් ව්‍යාපාර විද්‍යාලයට ඇතුල් වීමෙන් සහ "මිලිටරියත් සමග ඒක බේරා ගැනීමෙන්" ආපසු නිවෙස්වලට පැමිනිය හැකි වේ ද?

තමන් බලයට පැමිනීමෙන් අනතුරුව ලක්ෂ 30කට ආසන්න රැකියා අතුගා දැමුන ආර්ථික අර්බුදයේ ගොදුරු බවට පත්වූ අය කෙරෙහි ද බුෂ් එවැනිම අවඥාවක් පෙන්නුම් කලේ ය. ඔහුගේ පරිපාලනයේ පදනමේ සාරය සම්පාදනය වන කෝටි ප්‍රකෝටිපතියන් වෙතට අති විශාල ලෙසින් වාසි වන ස්ථිරසාර සහ අති දැවැන්ත බදු කප්පාදුව ඊට විසඳුම් බව බුෂ් දැඩිලෙස කියා සිටියේ ය.

මතුවී පෙනෙන දේ නම්, සිය පෞද්ගලික ධනස්කන්ධය ගොඩගසා ගැනීමේ ඔල්මාදය සමග එක පෙලට සිටිමින් විදේශයන්ගේ යුද්ධය සහ රට තුල ආර්ථික කොල්ලය වන පිලිවෙතක් දිගටම ගෙනයාමට අධිශ්ඨාන කරගෙන සිටින පාලක ප්‍රභුවක් වෙනුවෙන් කථාකරන බුද්ධිමය සහ සදාචාරමය නිකමකුගේ පින්තාරුවකි.

පැයක් තිස්සේ දිග්ගැස්සුනු සැසියේ අවසානයේ දී බුෂ් සහ රසට් අතර ඇතිවූ ඉතාම රූක්ෂ වූ සංවාදයන් ගෙන් එකක් මෙසේ ය:

රසට් : ඔබ පරාද වන්න සූදානම් ද?

බුෂ් : නෑ. මම පරාද වන්නේ නෑ.

රසට්: එහෙම උනොත් ඔබ මොනවද කරන්නේ?

බුෂ් : ආ මම පරාදය මත සැලසුම් කරන් නෑ. මට රට වෙනුවෙන් කරන්නට අවශ්‍ය මොකක්ද කියල දර්ශනයක් තියෙනවා. මෙහෙ බලන්න, මම නායකත්වය දෙන්නේ කොයි දිසාවටද කියල මම හරියටම දන්නවා.

මෙය බුෂ්ගෙ කටින් පිටවෙන විට එය දේශපාලන අපේක්ෂකයකුගේ ආත්ම විශ්වාසය සම්පාදනයක් ලෙස ප්‍රකාශයට පත් වීමක් නොවේ. ජනතා ඡන්දයෙන් පරාදය වීම නොතකා ශ්‍රේෂ්ඨාධිකරනයේ දක්ෂිනාංශික කන්ඩායමක් විසින් නිලයේ වාඩි කරවනු ලැබූ ඡන්දයෙන් තෝරා නොගැනුනු, නීත්‍යානුකූල නොවූ ජනාධිපතියකු වන බුෂ් තමන් "පරදින්නේ නැත" යනුවෙන් දැඩිලෙස කීම පැහැදිලි තර්ජනයක් මතු කරයි. මේ, බලය පිලිබඳ සිය ග්‍රහනය රැක ගැනීම සඳහා යුද්ධය, කුපිතකාරිත්වය සහ ව්‍යවස්ථා විරෝධී විධිවිධානවල සරන යාමට සූදානම් පරිපාලනයකි.

බුෂ් ඔහුගේ සාකච්ඡාවේදී මතුකල මෙවන් තර්ජනයන්ට සහ යුද්ධයේ ද,සමාජ ප්‍රතිගාමීත්වයේ ද සමස්ත පිලිවෙතට පිලිතුර ඩිමොක්‍රැටින් පක්ෂය තුල හෝ එහි කිසිදු අපේක්ෂකයකු තුල නොමැත. බුෂ්ට මෙම පිලිවෙත පෙරට ගෙන යාමට ඉඩ සැලසුනේ ඩිමොක්‍රැටික් පක්ෂයේ දනින් වැටීම සේම ජනමාධ්‍යයේ කර්ට සහාය ද නිසා ය.

යුද්ධය සහ සමාජ පිලිවෙත් පිලිබඳව දැන් ඩිමොක්‍රැටික් අපේක්ෂකයන් ජනතාවාදී වාචාල දෙඩීම්වල යෙදීගෙන ඇතොත් ඒ ඇමරිකානු වැඩකරන ජනයා මත සංගත සහ බැංකුවල ආධිපත්‍යය වෙනුවට අව්‍යාජ දේශපාලන විකල්පයක් පැන නැංවීම වලක්වාලීමට හා ද්වි පක්ෂ ක්‍රමයට එන ඕනෑම බැරෑරුම් අභියෝගයක් අවහිර කිරීම සඳහා ය.

2004 මැතිවරනයේදී සමාජවාදී සමානතා පක්ෂය සහභාගීවන්නේ හරියටම එවැනි අභියෝගයක්, එනම් සමාජය සමාජවාදීමය ලෙස පරිවර්තනය කිරීම පිනිස සටන්වදින, ස්වාධීන කම්කරු පන්තික දේශපාලන ව්‍යාපාරයක් සූදානම් කරනු පිනිසය.

අපි කල් ඇතිවම මෙසේ අනතුරු අඟවමු. 2004 මැතිවරනයේ ප්‍රතිඵලය කවරක් වුව ද යුද්ධය හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ද සමාජ කොන්දේසි ද මත ප්‍රහාරය දිගටම සිදුවනු ඇත. මේවා හුදෙක් බුෂ් ධවල මන්දිරයේ සහ රිපබ්ලිකන් පක්ෂයේ ප්‍රතිපත්ති නොව සමස්තයක් ලෙස ඇමරිකානු පාලක ප්‍රභුවේ ප්‍රතිපත්තීන් ය. ඩිමොක්‍රැටික් ජනාධිපතියකුගෙන් බුෂ්ව විස්ථාපනය කිරීම මගින් පසුගිය තෙවසර මුලුල්ලේ පක්ෂ දෙකම විසින් හඹායනු ලැබූ මූලික ආර්ථික සහ දේශපාලන ගමන්මාවත ආපසු නොහැරවෙනු ඇත. මේ සඳහා ද්විපක්ෂ ක්‍රමයට තමන්ගේම විකල්පයක් පන්නරය ගන්වා ගත් පහලින් මතුවන ජනතා ව්‍යාපාරයක් අවශ්‍ය ය.

වර්තමාන මැතිවරන ව්‍යාපාරය තුල සසප තමන්වම පිහිටුවාගෙන ඇති කර්තව්‍යය වනුයේ එවැනි ව්‍යාපාරයක් සඳහා වන දේශපාලන සූදානම් කිරීම ය. දේශපාලන විශ්ලේෂනය උදෙසා *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* පිවිසෙන සියලු දෙනාගෙන් මා ද මගේ තරඟ සගයා වන ජිම් ලෝරන්ස් ද උදක්ම ඉල්ලා සිටින්නේ සසප මැතිවරන ප්‍රකාශය (සමාජවාදී සමානතා පක්ෂය එජ ජනාධිපතිවරන ව්‍යාපාරය නිවේදනය කරයි) කියවන ලෙසත්, අපේ ඡන්ද ව්‍යාපාරය හා එක්ව සසප දේශපාලන වැඩපිලිවෙල සහ 2004 මැතිවරනය තුල මෙම අරගලය ඉදිරියට ගෙන යාමට ගනු ලබන ප්‍රායෝගික පියවරයන් සාකච්ඡා කිරීමට කැඳවා තිබෙන මිචිගන්හි ඇන් ආබර්වල මාර්තු 13-14 ජාතික සම්මේලනයට සහභාගි වන ලෙසත් ය.

© www.wsws.org